DOI: 10.31357/fhssmst.2015.00104

# තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය මගින් අපරාධ පාලනය හා වැළැක්වීම

## (අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්)

හත්නාපිටියෙ ගමඇතිරාළලාගේ අසංගා සුමතිපාල

For DR/FGS
AR/FGS
02 FEB 2015

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති සපර්යේෂණ

පර්යේෂණය සඳහා 'අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති ක්‍රමය විෂය

යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

## - කතෘගේ ප්‍රකාශය -

මේ ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ඩබ්. ජයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහාද ඉදිරිපත් නොකරන ලද බවත්, වාචික පරීක්ෂණයේදී පරීක්ෂක මණ්ඩලය විසින් පෙන්වා දුන් සංශෝධනයන් නිවැරදි කරන ලද බවත් සහතික කරමි.

2015.02.02 ........................ ........................

දිනය අපේක්ෂකයාගේ අත්සන

## - උපදේශකවරයාගේ ප්‍රකාශය -

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍යය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

02/02/2015
දිනය

උපදේශකවරයාගේ අත්සන

මහාචාර්ය එම්.ඩබ්. ජයසුන්දර
අධ්‍යයනාංශ ප්‍රධාන
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

# පිදුම

ලේ කිරි කර පොවා

අපමණ දුක්විද..............

ආදරයෙන් හැදූ වැඩූ

ආදරණීය අම්මාට සහ තාත්තාට

සිප්සතර කියා දී.....

දැස මනස පෑදූ

ගුරු දෙවියන්ටත්

ගෞරවයෙන් පුදන්නෙමි..........

# පටුන

පිටු අංක

ප්‍රථම පරිච්ඡේදය

පර්යේෂණ යෝජනාව

1.1 මාතෘකාව

1.2 හැඳින්වීම

1.2.1 පර්යේෂණ ගැටළුව

1.2.2 උපන්‍යාසයන්

1.3 අරමුණු හා සීමාවන්

1.3.1 පර්යේෂණයේ අරමුණු

1.3.2 පර්යේෂණයේ සීමාවන්

1.4 මූලාශ්‍ර හා ක්‍රමවේදය

1.4.1 මූලාශ්‍ර

1.4.2 ක්‍රමවේදය

1.4.3 නියැදි ක්‍රමය

1.4.4 දත්ත රැස් කිරීමේ ක්‍රම

1.4.5 දත්ත විශ්ලේෂණය

1.5 පර්යේෂණ නිබන්ධයේ ආකෘතිය 1-26

දෙවන පරිච්ඡේදය

සාහිත්‍යමය විමර්ශනය

2.1 තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය පිළිබඳ පර්යේෂණවල වර්ධනය

2.2 තරුණ වරදකරුවන් සම්බන්ධයෙන් සිදු කළ පර්යේෂණ

2.3 ශ්‍රී ලංකාව තුළ තරුණ වරදකරුවන්

සම්බන්ධව සිදු කර ඇති පර්යේෂණයන් 27-48

තෙවන පරිච්ඡේදය

න්‍යායන් සහ සංකල්ප

3.1 තරුණ වරදකරුවා පිළිබඳ න්‍යායාත්මක විග්‍රහය

3.2 මනෝ සමාජීය මේරීම හා අපරාධ

3.2.1 ආනයන හා විහීනතා ව්‍යුහයන්

3.2.2 සංවර්ධනය වන විහීනතා න්‍යායන්

3.2.3 ආනයන හා විහීනතා අතර න්‍යායන් අතර අන්තර් ක්‍රියා

3.3 මනෝ සමාජීය මේරීම

3.4 හිර්ෂිගේ පාලන න්‍යාය 49-70

සිව්වන පරිච්ඡේදය

තරුණයින් අපරාධ කිරීමට හේතු

4.1 බාල යෞවුන් විය සහ අපරාධ

4.1.1 ආර්ථික හේතු සාධක

4.1.2 ඒක දෙමාපිය පවුල්

4.2 තරුණයින් අපරාධ කිරීමට බලපාන සමාජීය සාධක

4.2.1 පුම්තිරිබාවය සහ අපරාධ

4.2.2 ජනවාර්ගික වෙනස

4.3 යෞවනයින් විසින් සිදු කරන ආර්ථික හා සමාජ අපරාධ

4.4 තරුණ පුද්ගලයින් අපරාධ කිරීමට බලපාන හේතු සාධක හඳුනා ගන්නේ කෙසේද? 71-112

පස්වන පරිච්ඡේදය

වරදකරුවන් පුනරුත්ථාපනය හා සම්බන්ධ නෛතික පසුබිම

5.1 ප්‍රතිකාර වැඩසටහන් සහ ප්‍රත්‍යක්ෂ ක්‍රමවේදයන් තුළින් නැවත සමාජයට අනුකලනය කිරීම.

5.1.1 ප්‍රතිකාර වැඩසටහන් වල සාර්ථකත්වයට අත්‍යවශ්‍ය සාදක

5.1.2 වෙනත් පුනරුත්ථාපන අවශ්‍යතා

5.1.3 ප්‍රතිකාර වැඩසටහන්වල ප්‍රත්‍යක්ෂ බව තහවුරු වන වර්තමාන ක්‍රියාදාම

5.1.4 නැවත අනුකලනය ශක්තිමත් කිරීම

5.1.5 තරුණ වරද කරුවන්ට ලබා දෙන චර්යාත්මක වැඩසටහන

5.1.6 පුනරුත්ථාපන ප්‍රතිපත්ති

5.2 බාල අපචාර නිවාරණයට එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශය

5.3 තරුණ වරදකරුවා කෙරේ පවතින ශ්‍රී ලංකාවේ නීතිමය පසුබිම 113-165

5.3.1 ආරක්ෂාව හා රැකබලා ගැනීමේ අවශ්‍යතාවය ඇති දරුවන් හා තරුණයින්

හයවන පරිච්ඡේදය

තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ක්‍රමය හා සමීක්ෂණය තුළින් අනාවරණය වූ තොරතුරු

6.1 තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය

6.2 ශ්‍රී ලංකාවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය ක්‍රමය

6.3 රැඳවියන් සඳහා ක්‍රියාත්මක විශෝධන ක්‍රමවේද

6.4 තරුණ වරදකරුවන්ගේ අපරාධකාරී චර්යා රටාවන්

6.5 තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය මඟින් අපරාධ පාලනය හා වැළැක්වීම පිළිබඳව අදහස් බන්ධනාගාර නිළධාරීන්ගේ දෘෂ්ටිකෝණයෙන් 166-214

6.6 තරුණ වරදකරුවන් පිළිබඳ බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යා දත්ත වාර්තා

හත්වන පරිච්ඡේදය

නිගමන හා යෝජනා 215-219

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 220-234

ඇමුණුම්

# වගු සටහන් නාමාවලිය

## වගු


| | පිටු අංක |
|---|---|
| 6.4.1 වරද කරන විට වයස | 177 |
| 6.4.2 වරදේ ස්වභාවය | 180 |
| 6.4.3 අධ්‍යාපනය | 182 |
| 6.4.4 දඬුවම් කාලය | 183 |
| 6.4.5 වාර්ෂික බන්ධනාගාර ගත වීම | 187 |
| 6.4.6 පවුලේ පසුබිම | 188 |
| 6.5.1 වයස් මට්ටම | 191 |
| 6.2.2 පුනරුත්ථාපන ක්‍රමවේද | 194 |
| 6.6.1 වයස් අනුව සෘජුව ඇතුළත් කළ තීන්දු නොලැබූවන් | 197 |
| 6.6.2 වයස අනුව සෘජුව ඇතුළත් කළ තීන්දු ලැබූවන් | 198 |
| 6.6.3 දෛනික සාමාන්‍යය | 199 |
| 6.6.4 වයස අනුව අඹේපුස්ස පුහුණු පාසලට සෘජුව ඇතුළත් කළ තරුණ වරදකරුවන් ප්‍රමාණය | 200 |
| 6.6.5 විවාහක අවිවාහක තත්වය | 201 |
| 6.6.6 බාරකරුවන් විසින් පුහුණු පාසල සඳහා සෘජුව ඇතුළත් කිරීම | 202 |
| 6.6.7 ආයතන අනුව තරුණ වරදකරුවන්ගේ ජනගහනයට සංඛ්‍යාතය | 202 |
| 6.6.8 පවුලේ විස්තර අනුව අඹේපුස්ස පුහුණු පාසලට තරුණ වරදකරුවන් සෘජුව ඇතුලත් කිරීම | 203 |
| 6.6.9 මත් ද්‍රව්‍ය ලබාගත් සංඛ්‍යාතය | 203 |
| 6.6.10 අපචාරී තත්වය | 204 |
| 6.6.11 මානසික තත්වය | 204 |
| 6.6.12 තරුණ වරදකරුවන්ගේ අධ්‍යාපන මට්ටම අඹේපුස්ස පුහුණු පාසල | 205 |

6.6.13 දඬුවම් කාල සීමාව 208

6.6.14 දඬුවම් කාල සීමාව 209

6.6.15 රැකියා තත්වය 210

6.6.16 වරද පිළිබඳ තත්වය 210

6.6.17 හෙරෝයින් භාවිතය 212

6.6.18 මත් කුඩු ලබා ගත් ප්‍රමාණය 212

6.6.19 මත් කුඩු ලබා ගත් ස්ථාන 213

6.6.20 සංකූලතා තත්වයන් 213

## ප්‍රස්තාර සටහන් නාමාවලිය


පිටු අංක

6.4.1 වයස් මට්ටම 177

6.4.2 වරදකරුවන්ගේ වර්තමාන වයස 178

6.4.3 රැකියාව 179

6.4.4 තරුණයින් අපරාධ සිදු කිරීමට හේතු 181

6.4.5 ළමා වියේ සිදු කළ වැරදි 184

6.4.6 ළමාවියේ වැරදි සඳහා දෙමාපියන් ප්‍රතිචාර 185

6.4.7 අධ්‍යාපනය නොලැබීමට හේතු 186

6.4.8 පෙර බන්ධනාගාර ගතවීම 188

6.4.9 පුනරුත්ථාපන ක්‍රමවේද 186

6.5.1 බන්ධනාගාර නිලධාරීන්ගේ අදහස 191

6.5.2පුනරුත්ථාපන නිලධාරීන්ගේ ක්‍රමවේදය පිළිබඳ අදහස 193

6.3.3 පුනරුත්ථාපනයේ සාර්ථක අසාර්ථක භාවය 193

6.5.4 බන්ධනාගාරය තුළ තරුණ වරදකරුවන්ගේ හැසිරීම් 216

6.6.1 නාගරික හා ග්‍රාමීය තරුණ වරදකරුවන් ප්‍රමාණය 195

6.6.2 තීන්දු ලැබූ හා නොලැබූ තරුණ වරදකරුවන්ගේ දෛනික සාමාන්‍ය (පල්ලන් සේන තරුණ වදරකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය) 201

6.6.3 තීන්දු ලැබූ හා නොලැබූ තරුණ වරදකාරියන් පිළිබඳ සංඛ්‍යා දත්ත 205

6.6.4 තරුණයින් බහුලව සිදු කළ වැරදි 207

6.6.5 (2012) නොවැම්බර් මාසය වන විට තත්වය 207

6.6.6 මත් ද්‍රව්‍ය ලබා ගත් ක්‍රම 211

6.6.7 ගත් ක්‍රියාමාර්ග 214

## - ස්තුතිය -

මාගේ මෙම පර්යේෂණ නිබන්ධය සම්පාදනය කිරීමේදී උපදේශකත්වයෙන් කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ඩබ්. ජයසුන්දර ගුරුපියාණන්ට මාගේ හෘදයාංගම ස්තුතිය ගෞරවයෙන් පුද කර සිටිමි.

එසේම මා හට අවශ්‍ය පහසුකම් සලසමින් මා දිරිමත් කළ ආදරණීය දෙමාපියන්ටත් මාගේ අපමණ ස්තුතීය පුද කරමි.

අවශ්‍ය තොරතුරු සම්පාදනය කර දුන් පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ බන්ධනාගාර අධිකාරී තුමන්ට සහ බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් තුමාටත්, භාෂා පරිවර්තනය කරමින් මා හට සහය දුන් රොහාන් මල්දෙණිය මහතාටත් අනෙකුත් සියලුම බන්ධනාගාර නිළධාරීන්ටත්,

පරිගණක මුද්‍රණ කටයුතු වලින් සහය දුන් තිළිණි උදයංගණි සොයුරිය ඇතුළු නන් අයුරින් සහය දුන් සියලු දෙනාටම මාගේ ගෞරවාදර ස්තුතිය පුද කරමි.

**එච්.ජී. අසංගා සුමතිපාල**

# තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය මඟින් අපරාධ පාලනය හා වැළැක්වීම

එච්.ජී. අසංගා සුමතිපාල

## නිබන්ධ සාරාංශය

මෙම පර්යේෂණ නිබන්ධය 'තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය මඟින් අපරාධ පාලනය හා වැළැක්වීම' යන තේමාව යටතේ ඉදිරිපත් කිරීම ඉතාමත් කාලෝචිත වැදගත් කමකින් යුක්ත යැයි මම සිතමි. පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය ක්ෂේත්‍ර කොට ගනිමින් සිදු කළ මෙම පර්යේෂණ නිබන්ධය සම්පාදනයේදී මූලික ගැටළුව වූයේ, තරුණ වරදකරුවන් සඳහා ක්‍රියාත්මක වන පුනරුත්ථාපන ක්‍රමය මඟින් අපරාධ පාලනය හා වැළැක්වීම කළ හැකිද? යන්නයි. නාගරීකරණය වන ග්‍රාමීය සමාජීය පරිසරය තුළ තරුණ ප්‍රජාව අපරාධ කෙරේ වැඩියෙන් යොමු වීම දක්නට ලැබෙන කාරණයකි. ඒ සඳහා පුනරුත්ථාපනය දායක වන ආකාරය මෙම පර්යේෂණය තුළින් අවබෝධ කර ගත හැකිය. ක්‍රමාන්විත නියදි ක්‍රමය යටතේ මෙහිදී දත්ත එක් රැස් කළ අතර ඒ සඳහා සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් භාවිතා කළෙමි. මෙම පර්යේෂණයෙන් අනාවරණය කර ගත් මූලික තොරතුරු අනුව නව යොවුන්වියේ දරුවන් වැඩියෙන් අපරාධ සිදු කිරීමට හේතු වන්නේ ආර්ථික දුෂ්කරතා, පියාගේ බීමත්කම, මව හෝ පියා අහිමිවීම, අඩු අධ්‍යාපනය යන සාධකයන් ය. එමෙන්ම පුනරුත්ථාපන ක්‍රමයේ පවතින අඩුලුහුඩුකම් නිසා තරුණයින් නැවත නැවතත් අපරාධ සිදු කිරීම නොවැළැක්විය හැකිය. ඒ අනුව මෙම පර්යේෂණයෙන් බන්ධනාගාර නිලධාරීන්ට පුනරුත්ථාපනයේ පවතින අඩු ලුහුඬුකම් මඟ හරවා ගෙන සාර්ථක පුනරුත්ථාපන ක්‍රමවේදයක් තුළින් තරුණ ප්‍රජාව අපරාධ සිදු කිරීමෙන් වළක්වා ගැනීමට, මහඟු පිටුවහලක් ලැබේ යැයි මම සිතමි.

# තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය මඟින් අපරාධ පාලනය හා වැළැක්වීම

## 1.1 මාතෘකාව

තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය මඟින් අපරාධ පාලනය හා වැළැක්වීම '' පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක් (පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය ඇසුරෙන්)

## 1.2 හැඳින්වීම

ගෝලීයකරණය නැමැති සංකල්පය හා සමගාමීව දිවෙන ප්‍රබල වූත් දිනෙන් දින ඉහළ යන ජන සනත්වය හමුවේ පාලනය කළ නොහැකි තරම් සංකීර්ණ ගැටළුවක් බවට පත්ව තිබෙන තවත් සුවිශේෂී සංකල්පයක් වන්නේ 'අපරාධ' නැමැති සංකල්පයයි. එය කිසිදා සර්ව සුබවාදී ලෙස විශ්ලේෂණය කළ නොහැක. 'අපරාධ' යන්න මානව සංහතිය බිහි වූ දා 0පටන් සමාජ, ආර්ථික, දේශපාලන යන විවිධාකාර වූ අංශ තුළ පමණක් නොව පවුල යන කුඩා ඒකකය තුළද මැනවින් විශද වන්නා වූ ගැටළුවක් ලෙස හඳුනාගත හැකිය. දේශීය මෙන්ම විදේශීයව ද පවතින අපරාධ වැඩිවීම නීතිය තුළින් පාලනය කිරීමට දුෂ්කර බව වත්මන් සියවස පුරාවට හඳුනාගත හැකි ලක්ෂණයකි. සමාජයක ඇති සම්පත් බෙදීයාමේ විෂමතාව හා සමාජයේ පවතින අනෝමීය තත්වයන් මත වත්මන් තරුණ ප්‍රජාව අපරාධ කෙරේ යොමු වීම නොවැළැක්විය හැකි තරමේ කරුණක් බවට පත්ව තිබේ. රටක වටිනාම සම්පතක් ලෙස තරුණ ප්‍රජාව හඳුනාගත හැකිය. මෙහිදී තරුණයා යනු කවරෙක්ද? සහ තරුණ වරදකරුවා යනු කවරෙක්දැයි නීතිමය අර්ථ විග්‍රහයන් තුළින් මෙන්ම විවිධ විද්වත් මතවාද ඇසුරෙන් විමසා බැලීම කාලෝචිතය. මේ අනුව තරුණයා සහ තරුණ වරදකරුවා පිළිබඳව සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව සහ නීතිය යන විෂයන් ඔස්සේ අර්ථ විග්‍රහ කර තිබේ. ඒ අනුව තරුණයෙකු වශයෙන් හඳුන්වනුයේ ''සමාජ වගකීම් බාර ගත හැකි වයසේ පසුවන සාමාජයේ නිත්‍ය සමාජිකයෙකි.' (අතුකෝරාල, 2010 :

පිටු 07) තවත් සරලව තරුණයා යන්න අර්ථ කථනය කරන්නේ නම්, 'ප්‍රචණ්ඩකාරී හා විප්ලවකාරී අදහස් පෙරදැරි කරගත් වයස අවුරුදු 16-22 අතර වයසේ පසුවන පුද්ගලයන්' වේ. (එම : පිටු 08).

මේ අනුව වයස අවුරුදු 16 ඉක්මවූ සහ 22 නොඉක්මවූ පිරිස තරුණ ප්‍රජාව ලෙස පැහැදිලිව හඳුනා ගත හැකි වේ. නමුත් සමාජ මනෝ විද්‍යාඥයින්ගේ අර්ථ විග්‍රහයන්ට අනුව තරුණයා ලෙස හඳුනාගත හැකි වයස් සීමාව වෙනස් වේ.

මිනිස් දිවිය යුග හතකින් සමන්විත වන බව විලියම් ශේක්ෂ්පියර් (Williem Shekspir) ප්‍රකාශ කර තිබේ. ඉන් තරුණ විය ලෙස ඔහු අර්ථ දක්වා ඇත්තේ වයස අවුරුදු 21-24 ත් අතර වයසේ පසුවන පුද්ගලයන්ය. (ගමාච්චි, 2005 : පිටු 27)

යොවුන්විය සම්බන්ධව නූතන මනෝ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කළ ප්‍රථම පුද්ගලයා වන්නේ G. Stanely Hall (1844-1924) (ජී. ස්ටැන්ලි හෝල්) ය. මනෝ විද්‍යාඥයෙකු වන ඔහු තරුණ වියට අදාළ වයස් සීමාව වශයෙන් අර්ථකථනය කර ඇත්තේ අවුරරුදු 14-28 අතර වයස් පරාසයයි. ( Hall; 1904 ; 2 vol)

යේල් සරසවියේ ළමා සංවර්ධන සායනයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ තවත් මනෝ විද්‍යාඥයෙකු ලෙස ආර්නෝල්ඩ් ගෙසල් (Arnold Gesell) (1880-1961) හැඳින්විය හැකිය. ඔහු තරුණ විය ලෙස අවුරුදු 16-30 අතර කාලය හඳුන්වා දී තිබේ. (Gesell, 1956 ;පිටු 61)

B. Elizabeth Tlurlock (බී. එලිසබෙත් හර්ලෝක්) (1981) නැමැති මනෝ විද්‍යාඥයා විසින් අවුරුදු 14-21 ත් අතර කාලය තරුණ විය ලෙස හඳුන්වා දී තිබේ. (අබේපාල, 2006 : පිටු 39) එමෙන්ම J.A. Hadfeild (ජේ.ඒ හැඩ්ෆීල්ඩ්) (1960) විසින් වයස වුරුදු 18-28 ත්

අතර කාලය තරුණ විය ලෙස අර්ථ දක්වා ඇති අතර C.M. Flemming (සී.එම් ෆ්ලෙමින්) විසින් අවුරුදු 14-24ත් කාලය තරුණ විය ලෙස හඳුන්වා දී තිබේ. (එම : පිටු 39)

මෙම තරුණ වියේ පසුවන පුද්ගලයා හට මුහුණපාන්නට තිබෙන විවිධ සමාජීය හා මනෝ විද්‍යාත්මක සාධක හේතුවෙන් තරුණ විය ඔහුට අර්බුදකාරී යුගයක් ලෙස හැඟෙන්නට බොහෝ ඉඩ ප්‍රස්තාවන් තිබේ. එවන් සාධක ඔහු වරදකරුවෙකු බවට පත් කිරීමට බලපාති. තරුණ වියට අදාළ වයස් කාණ්ඩ විවිධ විචාරකයන් විසින් අර්ථකථනය කර තිබේ.

එංගලන්තයෙහි අපරාධයට වගකිව යුතු වයස ආරම්භ වන්නේ වයස අවුරුදු 10දිය. (1964 පෙර එය අවුරුදු 08 විය) මේ වයස  මේ වයස සම්පූර්ණ වුවත් මේ සම්බන්ධව දරණ මතය වන්නේ සිතාමතා අපරාධකාරී චේතනාවෙන් යමක් කිරීමට තරම් හැකියාවක් ඇති සහ නීතියානුකූල දඬුවමකට පත් විය හැකි බවයි. නමුත් වයස 17 වන තෙක්ම මෙම අපරාධකරුවන් සම්බන්ධව වගකිව යුතු වන්නේ විශේෂ බාල වරදකරුවන් සඳහා වූ (Juvenile ) අධිකරණයි. අපරාධ නීතිය, දණ්ඩ නීතියේ පූර්ණ දැඩි බවෙන් ඔවුන් ආරක්ෂා කරනු ලැබේ. ඉන්පසුව වුවත් වයස 21 වන තෙක්ම බාල අපරාධකරුවන්ට පූර්ණ වැඩිහිටි තත්වයට පත් නොවීම නිසා යම් විශේෂ සැලකිල්ලක් ලැබේ. මෑතක පිහිටුවා ඇති නීති අපේක්ෂා කරන්නේ 21ට අඩු පුද්ගලයින් සාමාන්‍යයෙන් සිරබාරයට නොගෙන භාරකාර තීන්දු ලැබුණු විට ඔවුන් වැඩිහිටියන්ට වඩා වෙනස් ආයතනවල හෝ රඳවන ස්ථානවල රඳවා තැබීමටයි. බාල වරදකරුවන් යන වදන වයස 21ට අඩු සියල්ලෝම ආවරණය කර ඇත. බෝස්ටාල් ((Borstal) ආයතන වලින් නිදහස් වී නැවත වරදකරුවන් වූ අය හැරුණු විට සහ වසර 3ට වැඩියෙන් බරපතල අපරාධවලට වරදකරුවන් වූවන් හැරුණු විට) (west, 1967, පිටු 11-12)

නිශ්චිත වශයෙන් සහ අංග සම්පූර්ණ ලෙස බාල අපරාධ යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි නිර්වචනය කිරීම එතරම් පහසු නැත. විශේෂයෙන් බාලවයස්කරුවන් ගත් කල මෙය කැපී පෙනෙන දෙයකි. ළදරුවන් නොදැනුවත්කම නිසා තහනම් භාණ්ඩයක් සොරකම් කළ හැක. ඊට හේතු වන්නේ වයස වැඩි වත්ම සිදුවන ස්වයං පාලනය ඔවුන් තවමත් අබෝධ කරගෙන නොතිබීමයි. බාල යෞවනයන් නීතිය කඩ කරනුයේ ඔවුන්ගේ නිර්භීතකම හුවා